ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ (“කොමිෂන් සභාව”) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂයපථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන

වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැළසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව කොමිෂන් සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කොමිෂන් සභාව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
	2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ 01/2021			
i	ආයතනික යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ 2.6 වගන්තිය	ප්‍රධාන විධායක නිලධාරියා හෝ ආයතනය තුළ දැනටමත් වෙනත් කාර්යභාරයක නියැලී සිටින වෙනත් සේවකයෙකු අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් ලෙස පත් නොකළ යුතු වුවද, අධ්‍යක්ෂක මණ්ඩලයේ ලේකම් ලෙස කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කර තිබුණි.	යහපාලන ප්‍රමිතීන් සමඟ අනුගතවීම සහ භූමිකාව පිළිබඳ පැහැදිලිකම ඉදිරියට ගෙන යාම සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව ආයතනය විසින් විකල්ප ව්‍යුහයක් පිළිබඳව ඉදිරියේදී සලකා බලනු ඇත.	රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
	3.2 වගන්තිය	ශේෂ පත්‍ර දිනයෙන් පසු මාස පහක් ඇතුළත සහ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර වාර්ෂික කාර්ය සාධන සමාලෝචන රැස්වීම් පැවැත්විය යුතු බවට නියම කර තිබුණද, 2022, 2023 සහ 2024 වර්ෂ සඳහා වාර්ෂික කාර්ය සාධන සමාලෝචන රැස්වීම් (APRM) මෙම විගණන වාර්තාවේ දිනය වන විටත් පවත්වා නොතිබුණි.	2022, 2023 සහ 2024 වර්ෂ සඳහා කාර්ය සාධන වාර්තා මුදල් අමාත්‍යාංශය වෙත (MoF) දැනටමත් ඉදිරිපත් කර ඇති අතර 2022 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුව විසින් අනුමත කර ඇත. ඉදිරියේදී , සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව මුදල් අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය වෙමින් මාර්ගෝපදේශවලට අනුකූලව වාර්ෂික කාර්ය සාධන සමාලෝචන රැස්වීම් කාලෝචිත ලෙස පැවැත්වීම සහතික කිරීමට කටයුතු කරනු ඇත.	- එම -
	ඇමුණුම III	2024 වර්ෂය සඳහා වූ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාවේ, අවදානම් තක්සේරු කිරීම සහ අවම කිරීමේ උපාය මාර්ග, මූල්‍ය	අරමුදල් තුනක මූල්‍ය කාර්ය සාධනය වත්මන් වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇති අතර එය ඉදිරියටත් ඇතුලත් කරනු	- එම -

	කාර්ය සාධනය විශ්ලේෂණය සහ පෙර වසර 10 සඳහා මූල්‍ය ඉස්මතු කිරීම් ඇතුළු අවශ්‍ය ප්‍රධාන හෙළිදරව් කිරීම් කිහිපයක් ඇතුළත් කර නොතිබූ බව නිරීක්ෂණය විය. මෙම ක්ෂේත්‍ර මඟ හැරීම වාර්ෂික වාර්තාවේ සම්පූර්ණත්වයට බලපාන අතර තීරණ ගැනීමට භාවිතා කිරීමේදී එහි ඵලදායී බව අඩු විය හැකිය.	ඇත . තවද ආයතනයේ මූල්‍ය කාර්ය සාධනය ද එයට එකතු කරනු ඇත. අවදානම් තක්සේරු කිරීම සහ අවම කිරීමේ උපාය මාර්ග සහ පසුගිය වසර 10 සඳහා මූල්‍ය ඉස්මතු කිරීම් ද ලබන වසරේ සිට වාර්ෂික වාර්තාවට එකතු කරනු ඇත.	
රාජ්‍ය ව්‍යාපාර මෙහෙයුම් අත්පොත 6.6 වගන්තිය	කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2024 වර්ෂය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් සමඟ විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.	නියමිත දින 60 ක කාලය තුළ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදී. කෙසේ වෙතත්, කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඒ සමගාමීව ඉදිරිපත් කර නොමැත. ඉදිරි වසරවලදී ලේඛන දෙකම එකට ඉදිරිපත් කිරීම සහතික කිරීමට කොමිෂන් සභාව බැඳී සිටිනු ඇත.	- එම -

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය, ශුද්ධ මෙහෙයුම් වියදම් සඳහා සෙස් අරමුදලින් මාරුකිරීම් සැලකිල්ලට ගැනීමට පෙර රු. 645,930,836 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේදී ඌණතාවය රු. 446,662,381 ක් විය. එබැවින් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 199,268,455 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඌණතාවය වැඩිවීමට ප්‍රධාන හේතු ලෙස පිළිවෙලින් රු.164, 073, 632 කින් සහ රු.38, 013,834 කින් මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය (FSMP) වෙතින් ලැබුණු ප්‍රතිඵල පාදක අරමුදල්වලින් ලැබෙන ආදායම අහිමි වීම සහ සමාලෝචිත වර්ෂය තුළ පුද්ගල පිරිවැය වැඩිවීම දැක්විය හැකිය.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ ප්‍රධාන ආදායම් සහ වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය සමඟ විශ්ලේෂණය කර පහත දක්වා ඇත.

	2024 රු.	2023 රු.	වෙනස ප්‍රතිශතයක් ලෙස %
<u>කොමිෂන් සභාවේ ආදායම</u>			
බලපත්‍ර ගාස්තුව	25,123,028	4,100,649	513%
අධ්‍යාපනික වැඩසටහන්	12,836,609	11,629,061	10%
රජයේ ප්‍රදාන (මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය)	12,365,239	176,438,871	(93)%

<u>**කොමිෂන් සභාවේ වියදම්**</u>			
කාර්යය මණ්ඩල වැටුප්	431,513,003	393,499,169	10%
පරිපාලන සහ ආයතනික වියදම්	256,769,019	236,006,969	9%
ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන වියදම්	37,907,073	36,029,791	5%

අ. ලෝක බැංකුවේ මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය (FSMP) මගින් කොමිෂන් සභාව වෙත පහත සඳහන් සංරචක දෙක යටතේ අරමුදල් ලැබී ඇත.

සංරචකය I – ප්‍රතිඵල පාදක මූල්‍යකරණ සංරචකය

ලෝක බැංකුව විසින් මුදල් නිකුත් කිරීම හා සම්බන්ධ ප්‍රතිඵල (DLRs) ලෙස දක්වා ඇති හඳුනාගත් ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සාර්ථකව නිම කිරීමෙන් පසු, වෙන් කරන ලද අරමුදල් සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව වෙත බෙදා හරින ලදී. ඒ අනුව, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් සංරචක I යටතේ දක්වා ඇති සියලුම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අයිතම සාර්ථකව සම්පූර්ණ කළ අතර, ඇමරිකානු ඩොලර් මිලියන 2 ක වෙන් කරන ලද අරමුදල් ලැබී ඇත. (එය රු. 533,396,869.32 ට සමාන වන අතර, ඉන් රුපියල් 164,073,632.20 ක අවසාන ගෙවීම 2023.03.24 දින සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව වෙත ලැබී ඇත.)

සංරචකය II – ආයෝජන පාදක මූල්‍යකරණ සංරචකය

මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘති යෙහි (FSMP) සංරචක II යටතේ, හඳුනාගත් භාණ්ඩ හා උපදේශන සේවා ප්‍රසම්පාදනය සහ කාර්ය මණ්ඩල ධාරිතා වර්ධනය සඳහා ලේකම් කාර්යාලයට අරමුදල් ලබා දී ඇත. ව්‍යාපෘතිය අවසන් වන විට, ලෝක බැංකුව සංරචක II යටතේ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත ඇමරිකානු ඩොලර් 519,059.54 (රු. 163,324,066.66 ට සමාන) මුදලක් ලබා දී ඇත. භාණ්ඩ ප්‍රසම්පාදනය සඳහා ලද අරමුදල් ප්‍රදානයක් ලෙස සලකනු ලැබූ අතර එහි ප්‍රයෝජනවත් ජීව කාලය පුරාවට එය ක්‍රමක්ෂය කිරීමෙන් විලම්භිත ආදායමක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 ආර්ථික නොවන ගනුදෙනු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛය මගින් අත්‍යවශ්‍ය නොවන සියලුම වියදම් නිසි පාලනයක් සහිතව අරපිරිමැස්මෙන් සිදු කළ යුතු බව නියම කර තිබුණද, සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ කොමිෂන් සභාව විසින් රුපියල් 8,489,239 ක කාර්ය මණ්ඩල සුභසාධන වියදම් දරා ඇති බව නිරීක්ෂණය විය. එහි නත්තල් සුහද හමුව	පුහුණු පිරිස් රඳවා තබා ගැනීම සහ ඵලදායී නියාමන මෙහෙයුම් සහතික කිරීම සඳහා ප්‍රධාන සාධක වන කාර්ය මණ්ඩල චිත්ත ධෛර්යය, ආයතනික සංස්කෘතිය සහ සේවක යහපැවැත්ම ශක්තිමත් කිරීම සඳහා වියදම් දරන ලදී. මෙම වියදම් සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සේවක නියැලීමේ සහ රඳවා ගැනීමේ උපාය මාර්ගයේ කොටසක් වන අතර ඒවා ආයතනික ප්‍රතිලාභ ලබා දෙන බැවින් ආර්ථික නොවන ගනුදෙනු වලින් වෙනස් වේ. 1997 සිට සම්ප්‍රදායක් ලෙස පැවති වාර්ෂික	අත්‍යවශ්‍ය නොවන සියලුම වියදම් දැඩි ලෙස සාධාරණීකරණය කළ යුතු අතර, පිරිවැය-ඵලදායී ආකාරයකින් සිදු කළ යුතු අතර, ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 හි විධිවිධානවලට අනුකූල විය යුතුය.

සඳහා රු. 6,275,880 ක්, පිරිත් වියදම් සඳහා රු. 1,768,083.47 ක්, විනෝදාස්වාදය සහ තෑගි සඳහා රු. 194,617 ක්, අවමංගල්‍ය කටයුතු සඳහා රු. 51,020 ක්, රෝහල්ගත සේවකයින් සඳහා පලතුරු කූඩ සඳහා රු. 35,738 ක් සහ සමුගැනීමේ තෑගි සහ උත්සව සඳහා රු. 163,900 ක් ඇතුළත් වූ අතර ඒවා එම චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනි වේ.

නත්තල් හමුව, 2019 න් පසු නැවත ආරම්භ කරන ලද්දේ, ඉහළ කාර්ය මණ්ඩල පිරිවැටුම ආමන්ත්‍රණය කිරීම සහ සමාන කණ්ඩායම් සහජීවනය ප්‍රවර්ධනය කිරීම සඳහා සම තත්ව සංවිධානවල භාවිතයන්ට සමානවය. ලේකම් කාර්යාලයේ කාර්යයන් සඳහා අවශ්‍ය නිල සබඳතා සහ නියාමන සහයෝගීතාව පවත්වා ගැනීම සඳහා ද ඇතැම් වියදම් අදාළ වේ.
සියලුම වියදම් වාර්ෂික ඇස්තමේන්තුවලට ඇතුළත් කර ඇති අතර, කාර්ය මණ්ඩල සුභසාධනය, ධාරිතා වර්ධනය සහ අභ්‍යන්තර මෙහෙයුම් සඳහා සෙස් අරමුදල් සම්පත් භාවිතා කිරීමට අවසර ලබා දෙන සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 156(2) වගන්තියට අනුකූලව සිදු කරන ලදී. මානව ප්‍රාග්ධනය සහ මෙහෙයුම් අවශ්‍යතා සමඟ ආර්ථික විචක්ෂණභාවය සමතුලිත කිරීම සඳහා මෙම ක්‍රියාකාරකම් සද්භාවයෙන් සිදු කරන ලදී.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය

සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 16(ඩ) සහ 16(ණ) වගන්ති ප්‍රකාරව, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත, රෙගුලාසි, රීති, නියෝග හෝ උපදෙස් උල්ලංඝනය කිරීම් ඇතුළුව වෙළඳපොළ ආයතනයක, වෙළඳපොළ අතරමැදියකුගේ, ලියාපදිංචි තැනැත්තකුගේ, ලැයිස්තුගත පොදු සමාගමක සහ ලැයිස්තුගත විදේශීය අස්තිත්වයක යම් කටයුත්තක් පිළිබඳව විභාග කිරීමට සහ විමර්ශන පැවැත්වීමට සහ අවශ්‍ය පරිදි බලාත්මක කිරීමේ පියවර ගැනීමට කොමිසමට බලය පවරා ඇත. කෙසේ වෙතත්, විමර්ශන සිද්ධීන් සැලකිය යුතු සංඛ්‍යාවක් දිගු කාලයක් මුළුල්ලේ නොවිසඳී පවතින බව නිරීක්ෂණය විය. 2025 අගෝස්තු 06 වන විට, සිද්ධීන් හතක් වසර 5-7 ක කාල

කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම

2024 වර්ෂය තුළ, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව මුළු විමර්ශන 62 න් 36 ක් අවසන් කර ඇත. (2023 සිට ඉදිරියට ගෙන එන ලද විමර්ශන 55 ක් සහ වසර තුළ නව ආරම්භ කරන ලද විමර්ශන හතක්).
වෙළෙඳපොළට සැලකිය යුතු බලපෑමක් ඇති කරන නව විමර්ශන කළමනාකරණය කරන අතරම, පැරණි විමර්ශන සම්පූර්ණ කිරීමට සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව කඩිසරව කටයුතු කරයි. උදාහරණයක් ලෙස, 2024 වර්ෂය තුළ, වසරකට වැඩි කාලයක් මුළුල්ලේ විභාග වෙමින් පැවති විමර්ශන 11 ක් අංශය විසින් විමර්ශනය කර අවසන් කරන ලදී.

නිර්දේශය

කාලෝචිත ලෙස ක්‍රියාත්මක කිරීම සහ වැඩිදියුණු කළ නියාමන කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා පැහැදිලි කාලරාමු සහ අධීක්ෂණ යාන්ත්‍රණ ස්ථාපිත කිරීම මගින් දිගු කාලීනව විභාග වෙමින් පවතින විමර්ශන අවසන් කිරීම කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.

සීමාවකුත් , එක් සිද්ධියක් වසර 2 ක කාල සීමාවකුත් විහාග වෙමින් පවතී. විමර්ශන අවසන් කිරීමේ එවැනි ප්‍රමාදයන් නියාමන අනුකූලතාව බලාත්මක කිරීම සඳහා කොමිසමේ ඇති හැකියාවට අහිතකර ලෙස බලපෑම, වෙළඳපල විශ්වාසය අඩපණ කිරීම සහ කොමිසම විභව නීතිමය සහ කීර්ති නාම අවදානම් වලට නිරාවරණය කිරීම සිදු කරනු ඇත.

3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ	2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙහි 4.2(අ) සහ (ආ) වගන්ති ප්‍රකාරව, ප්‍රසම්පාදන අස්තිත්වය (PE) විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම (MPP) සකස් කළ යුතු අතර, එයට අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂා කරන ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි (MPP) ලැයිස්තුගත කළ යුතුය. කෙසේ වෙතත්, කොමිසම ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි.	වර්තමානයේ, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව වාර්ෂික පදනමක් මත ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම (MPP) සකස් කරයි. මෙම ප්‍රවේශය කෙටිකාලීන සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වන අතර, ඉදිරියේදී, අනුකූලතාව සහතික කිරීම සහ උපායමාර්ගික ප්‍රසම්පාදන සැලසුම්කරණය වැඩිදියුණු කිරීම සඳහා අවම වශයෙන් වසර තුනක කාලයක් ආවරණය වන පරිදි පුළුල් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් (MPP) සංවර්ධනය කිරීමට, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව පියවර ගනු ඇත.	ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ අදාළ චක්‍රලේඛවලට අනුකූලව ක්‍රියාමාර්ග ගත යුතුය.
ආ	2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙහි 4.2(ඇ) සහ (ඉ) වගන්ති ප්‍රකාරව, ප්‍රසම්පාදන අත්පොතෙහි 4.2.1 වගන්තියෙහි දක්වා ඇති නිශ්චිත ආකෘතිය භාවිතා කරමින් ඉදිරි වර්ෂය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් විස්තරාත්මකව සකස් කළ යුතු අතර මාස හයකට නොවැඩි කාල පරතරයකින් යාවත්කාලීන කළ යුතුය. කෙසේ වෙතත්, කොමිෂන් සභාව විසින් 2024 වර්ෂය සඳහා එවැනි ප්‍රසම්පාදන සැලැස්මක් නියමිත ආකෘතියෙන් සකස් කර නොමැති අතර, ඒ අනුව යාවත්කාලීන කිරීමද සිදු කර නොමැත.	ඉදිරියේදී, ප්‍රසම්පාදන අත්පොතට අනුකූලව පවත්වා ගැනීම සඳහා, නියමිත ආකෘතියේ මාස හයකට නොවැඩි කාල පරතරයන් තුළ යාවත්කාලීන කිරීම සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් සහතික කරනු ඇත.	-එම-

3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සේවා මට්ටමේ ගිවිසුම් කිහිපයක් (SLAs) ඒවායේ වලංගු කාල සීමාවන් ආරම්භ වීමෙන් පසුව සැලකිය යුතු ප්‍රමාදයන් සහිතව ක්‍රියාත්මක කර ඇත. සම්මත වාර්ෂික නඩත්තු ගිවිසුම මාස 2 යි දින 18 කින්, DMS - යෙදුම් මෘදුකාංග නඩත්තු ගිවිසුම මාස 3 කින්, සම්මත නඩත්තු කොන්ත්‍රාත්තුව මාස 3 යි දින 1 කින්, නඩත්තු ගිවිසුම මාස 1 යි දින 21 කින් සහ බලපත්‍ර අලුත් කිරීම් සහ නඩත්තු ගිවිසුම මාස 6 යි දින 18 කින් ප්‍රමාද වී තිබුණි.	නියමයන් සහ කොන්දේසි තහවුරු කර අවසන් කිරීම සඳහා බලාත්මක වන දිනට මාස දෙකකට පෙර කොන්ත්‍රාත් සාකච්ඡා ආරම්භ විය. සාකච්ඡා ක්‍රියාවලියට කාලය ගත වුවද, සේවා සපයන්නන් සමඟ එකඟ වූ අවසාන කොන්ත්‍රාත් නියමයන් අවසානයේ දී ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවට වඩාත් වාසිදායක විය. සේවා මට්ටමේ ගිවිසුම් (SLA) අත්සන් කිරීමේ ප්‍රමාදයන් තිබියදීත්, මෙම කාල සීමාව තුළ කිසිදු සැපයුම්කරුවෙකුගෙන් සේවා බාධා ඇති නොවීය. තවද, මෙම ප්‍රමාදයන් පද්ධති ක්‍රියාකාරිත්වයට හෝ අවසාන පරිශීලකයින් සඳහා ක්‍රියාත්මක කාලයට බල නොපා ඇති බව DTD සහතික කරයි. ඉදිරියේදී, සේවා මට්ටමේ ගිවිසුම් (SLA) නියමිත බලාත්මක වන දිනට පෙර අවසන් කර අත්සන් කිරීම සහතික කිරීම සඳහා අමතර පියවර සමඟ කොන්ත්‍රාත් සමාලෝචන ක්‍රියාවලිය වැඩිදියුණු කර ඇත. තවද, සේවා මට්ටමේ ගිවිසුම් (SLA) පරිපාලනය කරනු ලබන්නේ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා (SEC) සැපයුම්කරුවන්ගේ කළමනාකරණ විසඳුම් පද්ධතිය හරහාය.	සේවා අඛණ්ඩතාව සහ ගිවිසුම්ගත අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීම සඳහා සියලුම සේවා මට්ටමේ ගිවිසුම් ඒවායේ බලාත්මක වන දිනට පෙර අවසන් කර ක්‍රියාත්මක කළ යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ	1988 අංක 74 දරන පනත මගින් සංශෝධනය කරන ලද 1975 අංක 1 දරන වත්කම් සහ බැරකම් ප්‍රකාශ නීතිය, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත සහ ආයතන සංග්‍රහයේ XXIX පරිච්ඡේදයට අනුව, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සේවකයින් ඇතුළු සියලුම රාජ්‍ය නිලධාරීන්, පත්වීම ලබා ගැනීමෙන් පසු වත්කම් සහ බැරකම් පිළිබඳ මූලික ප්‍රකාශයක් ලබා දිය යුතු අතර ඉන් පසුව	ඉදිරි වර්ෂයේ අප්‍රේල් 1 සිට මාර්තු 31 දක්වා කාලය ආවරණය වන පරිදි ජූනි මස අවසානයේදී සේවකයින්ගෙන් වාර්ෂික ප්‍රකාශන ලබා ගන්නා බව සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් තහවුරු කරයි. කෙසේ වෙතත්, ප්‍රකාශන කාලය තුළ තවමත් රාජකාරි භාර නොගත් සේවකයින්ට මෙම අවශ්‍යතාවය අදාළ නොවේ. මෙම නිරීක්ෂණය නිසි ලෙස සටහන්	වත්කම් සහ බැරකම් ප්‍රකාශ ආකෘති පත්‍ර සියලුම සේවකයින්ගෙන් සාමාන්‍ය 261 ආකෘති පත්‍රය භාවිතා කර ලබා ගත යුතු අතර ව්‍යවස්ථාපිත අවශ්‍යතා සමඟ පූර්ණ අනුකූලතාවයක්

	කාලානුරූපව යාවත්කාලීන කිරීම් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. ආයතන සංග්‍රහය ප්‍රකාරව, මෙම ප්‍රකාශන පත්වීම කරන ලද අවස්ථාවේදී නියමිත සාමාන්‍ය 261 පෝරමය භාවිතා කර ඉදිරිපත් කළ යුතු අතර, විනිවිදභාවය, වගවීම සහ ව්‍යවස්ථාපිත බැඳීම්වලට අනුකූල වීම සහතික කිරීම සඳහා සේවකයින්ගේ පුද්ගලික ලිපිගොනු වල පවත්වාගෙන යා යුතුය. කෙසේ වෙතත්, තෝරාගත් නියැදියෙහි කිසිදු සේවකයෙකුගේ පුද්ගලික ලිපිගොනු වල වත්කම් සහ බැරකම් ප්‍රකාශ පෝරමය ඇතුළත් කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර, එය ව්‍යවස්ථාපිත සහ අභ්‍යන්තර පාලන යන අවශ්‍යතා දෙකටම අනුකූල නොවීමක් පෙන්නුම් කරයි.	කර ගන්නා ලදී. ඉදිරියේදී, 2025 ජූලි මාසයේ සිට බඳවා ගත් සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ පුද්ගලික ලිපිගොනු වල වත්කම් සහ බැරකම් ප්‍රකාශ ආකෘති ඇතුළත් කරන බවට සංවිධානය විසින් සහතික කරනු ලබන ඇති අතර, එය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙහි (CIABOC) ක්‍රියා පටිපාටිවලට ද අනුකූල වන අතරම, ව්‍යවස්ථාපිත අනුකූලතා අවශ්‍යතාවලට ද අනුකූල වේ.	සහතික කිරීම සඳහා ඔවුන්ගේ පුද්ගලික ලිපිගොනු වල නිසි ලෙස පවත්වා ගත යුතුය.
ආ	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 165(1) වගන්තිය සහ 165(2) වගන්තිය ප්‍රකාරව අවශ්‍ය වන්නා වූ දිවුරුම් හෝ ප්‍රතිඥා, තෝරාගත් විගණන නියැදියෙහි කිසිදු සේවකයෙකුගේ පුද්ගලික ලිපිගොනුවක ඇතුළත් කර නොතිබුණි.	අදහස සටහන් කර ගන්නා ලදී. අනාගත පත්වීම් සඳහා බලපැවැත්වෙන පරිදි, සියලුම නව සේවකයින් විසින් අත්සන් කරන ලද දිවුරුම් ලේඛනයක් බඳවා ගැනීමේ ක්‍රියාවලියට ඇතුළත් කරනු ඇති බවට සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් සහතික කරනු ඇත.	ආණ්ඩුක්‍රම ව්‍යවස්ථවෙහි 165(1) සහ 165(2) වගන්ති ප්‍රකාරව අවශ්‍ය වන්නා වූ දිවුරුම් හෝ ප්‍රතිඥා ලේඛන සියලුම සේවකයින්ගෙන් ලබා ගත යුතු අතර ව්‍යවස්ථාමය අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීම සඳහා ඔවුන්ගේ පුද්ගලික ලිපිගොනු වල පවත්වාගෙන යා යුතුය.
ඉ	2025 ජූලි 31 වන විට අධ්‍යක්ෂ- ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන, අධ්‍යක්ෂ- අධීක්ෂණ, අධ්‍යක්ෂ-බාහිර සබඳතා සහ ප්‍රාග්ධන වෙළඳපොළ අධ්‍යාපන, අධ්‍යක්ෂ- මානව සම්පත් සහ අධ්‍යක්ෂ- පරීක්ෂණ ඇතුළු ප්‍රධාන අධ්‍යක්ෂ තනතුරු කිහිපයක් මාස 6 සිට අවුරුදු 2 කට වැඩි කාලයක් පුරප්පාඩු වී තිබුණි. තවද, 2024 ජූනි 04 වන දින අවදානම් කමිටුව විසින් ප්‍රධාන අවදානම් නිලධාරියෙකු වහාම බඳවා ගැනීමට තීරණය කර තිබියදීත් මෙම තනතුර ද පුරවා නොතිබුණි. මෙම වැදගත් උපායමාර්ගික තනතුරුවල දිගු කාලීන පුරප්පාඩු පැවතීම කොමිෂන් සභාවේ	ඉහත සඳහන් සියලුම පුරප්පාඩු පිරවීම සඳහා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව අයදුම්පත් කැඳවා මූලික සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබුණි. කෙසේ වෙතත්, මෙම තනතුරු සඳහා තෝරා ගන්නා ලද සියලුම අපේක්ෂකයින්, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ දැනට පවතින වැටුප් පරිමාණයන්ට වඩා ඉහළ වැටුප් අපේක්ෂා කළහ. වැඩ බැලීමේ/ආවරණය කිරීමේ කටයුතු සිදු කර ඇති බැවින් මෙම පුරප්පාඩු මගින් අදාළ අංශ කෙරෙහි ඇති කරන බලපෑම අවම කර ඇත. ඊට අමතරව,	අධ්‍යක්ෂ සේවක සංඛ්‍යාව කාලානුරූපීව සමාලෝචනය කර, අවශ්‍ය ගැලපීම් අනුමැතිය ඇතිව සිදු කළ යුතුය.

	යහපාලනය, අවදානම් කළමනාකරණය සහ සමස්ත මෙහෙයුම්වල ඵලදායීතාවයට අහිතකර ලෙස බලපෑ හැකිය.	ප්‍රධාන අවදානම් නිලධාරී තනතුර සඳහාද වසර තුළ දැන්වීම් පල කරනු ලැබේ.	
ඊ	2023 දෙසැම්බර් 31 වන දින සන්ඩේ ඔබ්සර්වර් හි, ටොප්ජොබ්ස්.එල්කේ (topjobs.lk) හි සහ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පළ කරන ලද දැන්වීම් හරහා කලමනාකරණ තනතුරු සඳහා අයදුම්පත් කැඳවන ලද අතර, එම අපේක්ෂකයින්ට සහකාර කලමනාකරණ/විධායක මට්ටමින් අවම වශයෙන් වසර අටක පළපුරුද්දක් තිබිය යුතු බව එහි නිශ්චිතව සඳහන් කර ඇත. කෙසේ වෙතත්, 2025 පෙබරවාරි 13 දිනැති කොමිෂන් සභා පත්‍රිකා අංක 510/14 ට අනුව, අමතර අවශ්‍යතාවයක් ලෙස ප්‍රාග්ධන වෙළඳපොළයන්හි අවම වශයෙන් වසර තුනක පළපුරුද්දක් හඳුන්වා දී ඇති අතර, එය ප්‍රකාශයට පත් කරන ලද දැන්වීම්වල පිළිබිඹු නොවීය. එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රකාශයට පත් කරන ලද නිර්ණායක සපුරාලන බාහිර අයදුම්කරුවන් සුදුසුකම් ලැබුවද වෙනත් ආකාරයකින් ප්‍රතික්ෂේප කරන ලද අතර, ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකරුවන් ලෙස වසර දෙකකට අඩු පළපුරුද්දක් ඇති අයද ඇතුළුව අභ්‍යන්තර අයදුම්කරුවන් කළමනාකරුවන් ලෙස බඳවා ගෙන ඇත.බඳවා ගැනීමේ නිර්ණායකවල මෙම නොගැලපීම තේරීම් ක්‍රියාවලියේ සාධාරණත්වය සහ විනිවිදභාවය පිළිබඳ ගැටළු මතු කරයි. සුදුසුකම් ලත් බාහිර අපේක්ෂකයින් බැහැර කිරීමෙන් කුසලතා මත පදනම් වූ බඳවා ගැනීම් අඩපණ කළ හැකි අතර, මෙම ක්‍රියාවලිය, ස්ථාපිත කරන ලද ප්‍රතිපත්ති සහ ප්‍රකාශයට පත් කරන ලද නිර්ණායකවලට සම්පූර්ණයෙන්ම අනුකූල නොවන බැවින් එය කොමිෂන් සභාවේ කීර්ති නාමයට සහ යහපාලනයට අවදානම් ඇති කරයි.	අපේක්ෂකයින් තෝරා ගැනීමේදී, වැඩි ප්‍රාග්ධන වෙළඳපොළ අත්දැකීම් ඇති අයට ප්‍රමුඛත්වය දීමට සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව තීරණය කරන ලදි. 2023 සහ 2024 කාලය තුළ සහකාර කළමනාකරණ සහ ඊට ඉහළ මට්ටමේ සේවකයින් 29 දෙනෙකු ඉල්ලා අස්වීමත් සමඟ මධ්‍යම මට්ටමේ කළමනාකරණය ශක්තිමත් කිරීමේ හදිසි අවශ්‍යතාවය මෙම තීරණයට හේතු විය.	සාධාරණත්වය, විනිවිදභාවය සහ ස්ථාපිත කරන ලද ප්‍රතිපත්තිවලට අනුකූල වීම සහතික කිරීම සඳහා, අවශ්‍ය සියලුම සුදුසුකම් ප්‍රකාශයට පත් කරන ලද දැන්වීම්වල පැහැදිලිව ඇතුළත් කළ යුතු අතර බඳවා ගැනීමේ ක්‍රියාවලිය පුරාම ඒකාකාරව අනුගමනය කල යුතුය.
උ	තනතුර අනුව අතිකාල ගෙවීම් සඳහා මසකට අනුමත සීමාවක් ස්ථාපිත කර නොතිබුණි. අතිකාල සඳහා මසකට නිශ්චිත සීමාවක් හෝ මාර්ගෝපදේශයක් නොමැතිකම නිසා ඒකාකාරී නොවන හෝ වැඩියෙන් ගෙවීම් සිදුකිරීම, විනිවිදභාවය	විධායක නොවන කාර්ය මණ්ඩලයට පමණක් අතිකාල ගෙවීම් සඳහා හිමිකම් ඇති අතර, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් අතිකාල ගෙවීම් සඳහා අනුමත සීමාවන් ඉදිරියේදී ක්‍රියාත්මක කරනු	අනුකූලතාව, විනිවිදභාවය සහ අයවැය ප්‍රතිපාදන සමඟ ගැලපීම සහතික කිරීම සඳහා, තනතුර අනුව අතිකාල ගෙවීම් සඳහා

	අඩුවීම සහ අයවැය ප්‍රතිපාදන සමඟ නොගැලපීම් ඇති විය හැකිය.	ඇත.	සීමාවන් අනුමත කර ස්ථාපිත කළ යුතුය.
ඌ	වැටුප් ගෙවීම් පද්ධතියට ප්‍රවේශ වීමට පවතින අභ්‍යන්තර පාලනයන් ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය. විශේෂයෙන්, නිවැරදි ආරක්ෂක පිළිවෙත්වලට පටහැනිව, පද්ධති මුරපදය නිතිපතා යාවත්කාලීන කර නොතිබීම, අනවසර ප්‍රවේශයට සහ දත්ත අඛණ්ඩතාව අඩපණ වීමේ අවදානම වැඩි කරනු ඇත. තවද, වැටුප් ගෙවීම් පද්ධතිය සඳහා එක් මුරපදයක් පමණක් පවතින අතර, මූල්‍ය අධ්‍යක්ෂවරයා හෝ වෙනත් බලයලත් නිලධාරියෙකු විසින් ද්විතියික ප්‍රවේශ මුරපදයක් ආරක්ෂිතව පවත්වාගෙන යන බව සහතික කිරීම සඳහා කිසිදු ක්‍රියා පටිපාටියක් ස්ථාපිත කර නොමැත. ප්‍රවේශ පාලනයේ මෙම දුර්වලතා නිසා එය අනිසි ලෙස භාවිතා කිරීමේ අවදානම වැඩි කරන අතර වැටුප් ගෙවීම් දත්තවල විශ්වසනීයත්වය සහ ආරක්ෂාව අඩපණ කරයි.	වැටුප් පද්ධති මුරපදය මෑතකදී යාවත්කාලීන කරන ලද අතර, නිවැරදි ආරක්ෂක පිළිවෙත්වලට අනුකූලව දින 90 ක චක්‍රයක් මත මුරපදය වෙනස් කිරීමට පියවර ගෙන ඇත. වර්තමානයේදී, අනවසර ප්‍රවේශය අවම කිරීම සඳහා එක් බලයලත් පරිශීලකයෙකුට පමනක් ප්‍රවේශ වීම සීමා කර ඇති අතර කෙසේ වෙතත් ද්විතියික ප්‍රවේශ මුරපදයක් නොමැතිකම වත්මන් වැටුප් පද්ධතියේ දුර්වලතාවයක් ලෙස හඳුනාගෙන ඇත. අනුකූලතාව සහ දත්ත ආරක්ෂාව වැඩි දියුණු කරන මෙන්ම වත්මන් පද්ධතියේ දුර්වලතාවයන් ඉවත් කිරීමට හැකි වන ලෙස, ඒකාබද්ධ වැටුප් ක්‍රියාකාරිත්වයක් සහිත පුළුල් මානව සම්පත් තොරතුරු පද්ධතියක් (HRIS) ක්‍රියාත්මක කිරීම සඳහා, 2025 සැප්තැම්බර් 16 වන දින පැවති 521 වන රැස්වීමේදී අනුමැතිය ලබාගෙන ඇත. එය වසර අවසන් වීමට පෙර සම්පූර්ණ කර ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.	ප්‍රමාණවත් ආරක්ෂාවක් සහ වගවීමක් සහතික කිරීම සඳහා වැටුප් ගෙවීම් ක්‍රමයට ප්‍රවේශ වීම පාලනය කරන අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කළ යුතුය.

3.6 වාහන සංචිතය කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
පවරා ඇති වාහන භාවිතයට අදාළ ක්‍රියා පටිපාටි සහ වගකීම් ගෙනහැර දක්වන විධිමත් ලේඛනයක් සංවිධානය විසින් පවත්වාගෙන නොයන අතර, එක් එක් වාහනය සඳහා වෙනම වගකිවයුතු පුද්ගලයෙකු පවරා නොමැත. මෙම දුර්වලතා අනිසි ලෙස භාවිතා කිරීමේ අවදානම, වගවීම නොමැතිකම සහ වාහන භාවිතය නිරීක්ෂණය කිරීමේ දුෂ්කරතා වැඩි කරයි.	පවතින ලේඛනයේ පොදු වාහන භාවිතය සඳහා වන කොන්දේසි පමණක් දක්වා ඇති බවත්, පවරා ඇති වාහන සඳහා අදාළ වන ක්‍රියා පටිපාටි විශේෂයෙන් සඳහන් නොකරන බවත් ආයතනය පිළිගනී. මෙම අඩුපාඩුව නිවැරදි කිරීම සඳහා, පොදු සහ පවරා ඇති වාහන දෙකටම සවිස්තරාත්මක ක්‍රියා පටිපාටි, වගකීම් සහ පාලනයන් ඇතුළත් සංශෝධිත ලේඛනයක් දැනට සමාලෝචනය කර අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටී. මේ අතරතුර, පවරා ඇති සෑම වාහනයක්ම එහි නිසි භාවිතය, නඩත්තුව සහ වාර්තා කිරීම සඳහා වගකිව යුතු නම් කරන ලද රියදුරෙකුට පවරා ඇත. සංශෝධිත ප්‍රතිපත්තිය විධිමත් ලෙස අනුමත	පවරා ඇති වාහන භාවිතය සඳහා අවශ්‍ය ක්‍රියා පටිපාටි සහ වගකීම් දැක්වෙන විධිමත් ලේඛනයක් අනුමත කර ක්‍රියාත්මක කළ යුතු අතර, වගවීම සහ ඵලදායී අධීක්ෂණය සහතික කිරීම සඳහා සෑම වාහනයක් සඳහාම නිශ්චිත වගකීමක් පැවරිය යුතුය.

කරන තෙක් වගවීම සහතික කිරීම සහ වාහන අධීක්ෂණය සහ පාලනය හා සම්බන්ධ අවදානම් අවම කිරීම සඳහා මෙම අතුරු විධිවිධානය ක්‍රියාත්මක කර ඇත.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ අතර, කළමනාකරණ පාලන මෙවලමක් ලෙස අයවැය ඵලදායී ලෙස භාවිතා කර නොමැති බව පෙන්නුම් කරයි. සාමාජික දායකත්වයේ 74% ක විචලනයක්, විදේශ පුහුණු සහ සම්මන්ත්‍රණ - කාර්ය මණ්ඩල සියයට 61 ක විචලනයක් සහ ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන වියදම් 53% ක විචලනයක් වාර්තා කළ අතර, තථ්‍ය වියදම් අයවැයගත ප්‍රතිපාදනවලට වඩා සැලකිය යුතු ලෙස අඩු වී ඇත. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සඳහා ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධනය කිරීමේ වැදගත්කම සහ තීරණාත්මක බව ඉහළ බැවින්, මෙම ක්ෂේත්‍රයේ අරමුදල් ඌන උපයෝජනය පිළිබඳව විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.ඉහත ක්ෂේත්‍ර තුන සම්බන්ධයෙන් මෙම විචලනයන්ගෙන් පෙන්නුම් කරන්නේ අයවැය ඇස්තමේන්තු, තථ්‍ය අවශ්‍යතාවලට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අධිතක්සේරු කර ඇති බවයි.	වැඩසටහන් කල් දැමීම්, අවලංගු කිරීම්, කාර්ය මණ්ඩල පිරිවැටුම සහ ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 මගින් පනවන ලද විදේශ පුහුණුව සඳහා සීමාවන් පැනවීම, අයවැයගත සහ තථ්‍ය වියදම් අතර වෙනසට ප්‍රධාන වශයෙන් හේතු විය. මහජන දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් සහ BBO සහ OMS ව්‍යාපෘතිය ඇතුළු සැලසුම් කළ වැඩසටහන් සහ ආරම්භකිරීම් කිහිපයක් කල් දැමීම හෝ ක්‍රියාත්මක කිරීම සිදු නොකළ අතර, ඩිජිටල් මාධ්‍යයෙන් පැවැත්වීම සහ අඩු පිරිසකගේ සහභාගීත්වය මත අධ්‍යාපනික වැඩසටහන් වල පිරිවැය අඩු විය. සමහර පුහුණු වැඩසටහන් සඳහා අයවැය තරමක් ඉක්මවා ගියද, මෙහෙයුම් සීමාවන් සහ උපායමාර්ගික නැවත වෙන් කිරීම් නිසා සමස්තයක් ලෙස වියදම් අඩු වූ අතර එය 2025 වසරේදී කියාත්මක කිරීම සඳහා වසරේ පසුබිම හේතු විය.	විශේෂයෙන් ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධනය වැනි තීරණාත්මක ක්ෂේත්‍ර සඳහා වෙන් කරන් ලද ප්‍රතිපාදන යථාර්ථවාදී සහ සම්පූර්ණයෙන්ම උපයෝජනයට ගන්නා බව සහතික කිරීම සඳහා අයවැය සැලසුම් කිරීම සහ අධීක්ෂණය ශක්තිමත් කළ යුතුය.